**කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාව - 2020**

----------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) උතුරු මැද පළාත්, පළාත් පාලන කොමසාරිස් විසින් 2019 දෙසැම්බර් 31 දින නිකුත් කරන ලද අංක 2019/02 දරන චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන නව ගිණුම්කරණ ක්‍රමයට අනුව ඉදිරිපත් කර ඇති බැවින් 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තිය ප්‍රකාරව ඉකුත් වර්ෂය සමඟ සැසඳිය නොහැක.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් වෙනුවෙන් රජයෙන් ලැබීම් රු.14,537,817 ක් වුවත් විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ එය රු.14,336,078 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ ලාභය රු.201,739 කින් අඩුවෙන් දක්වා තිබුණි. | පිළිගනිමි. | නිවැරදි පුනරාවර්තන වියදම් ප්‍රදාන වටිනාකම ගිණුම්ගත කළයුතු වේ. |
| (ආ) | ගිණුම්කරණ සටහන් 06 අනුව සමාලෝචිත වර්ෂයේ හුවමාරු නොවන ගනුදෙනුවලින් ලද ආදායම රු.5,318,827 ක් වුවත් විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ එය රු.5,325,377 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ ලාභය රු.6,550 කින් වැඩියෙන් දක්වා තිබුණි. | පිළිගනිමි. | නිවැරදි ආදායම ගිණුම්ගත කළයුතු වේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය සඳහා ලැබුණු රු.33,807,707 ක ප්‍රාග්ධන වියදම් ප්‍රදානය වත්කම් සහ වගකීම් ප්‍රකාශනයේ දක්වා නොතිබීම නිසා හිමිකම් වටිනාකම එම වටිනාකමින් අඩුවී තිබුණි. | පිළිගනිමි. | සභාවට ලැබෙන සියළුම ප්‍රාග්ධන ප්‍රදානයන් ගිණුම්ගත කළයුතු වේ. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සමුච්චිත ඌනතා ගිණුම් ශේෂය රු.549,789,459 ක් වුවත් එදිනට පිළියෙල කළ වත්කම් සහ වගකීම් ප්‍රකාශනයේ එය රු.572,792,233 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා හිමිකම් වටිනාකම රු.23,002,774 කින් වැඩියෙන් දක්වා තිබුණි. | පිළිගනිමි. | නිවැරදි හිමිකම් වටිනාකම ගිණුම්ගත කළයුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ජ'නල් සටහන්වලට අනුව පූර්ව කාලපරිච්ඡේදයට අදාළ ගැලපීම්වලින් සමුච්චිත අරමුදලට සිදුවන හර බලපෑම රු.2,725,348 ක් වියයුතු වුවත් ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයේ එය රු.8,274,774 ක බැර බලපෑමක් ලෙස ගිණුම්ගත කිරීම නිසා සමුච්චිත අරමුදල රු.11,000,122 කින් වැඩිවී තිබුණි. | පිළිගනිමි. | සමුච්චිත අරමුදලට වන බලපෑම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළයුතු වේ. |
| (ඊ) | සභාවට අයත් නොවන ඉදිකිරීම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී සභාව විසින් වැයකළ රු.1,093,330 ක් සභාවේ ගොඩනැගිලි යටතේ ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කිරීම නිසා සභාවේ වත්කම් එම වටිනාකමින් වැඩිවී තිබුණි. | පිළිගනිමි. | සභාවට අයිති ගොඩනැගිලි පමණක් සභාවේ ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කළයුතු වේ. |
| (උ) | ස්ථාවර වත්කම් ඉවත්කිරීමේදී සමුච්චිත ක්ෂය වටිනාකම ඉවත්කිරීමේ ගිණුමට මාරු නොකිරීම නිසා ස්ථාවර වත්කම් විකිණීමේ ලාභය රු.30,000 කින් අඩුවී තිබුණි. | පිළිගනිමි. | ස්ථාවර වත්කම් ඉවත් කිරීමේදී එම වත්කම්වල සමුච්චිත ක්ෂය ඉවත් කිරීමේ ගිණුමට මාරු කළයුතු වේ. |
| (ඌ) | සමාලෝචිත වර්ෂයේදී සංවර්ධන ව්‍යාපෘති 25 ක් යටතේ බෝක්කු 35 ක් ඉදිකිරීම සඳහා රු.6,405,039 ක් වියදම් කර තිබුණු නමුත් එය රු.12,386,285 ක ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කිරීම නිසා ස්ථාවර වත්කම් රු.5,981,246 කින් වැඩිවී තිබුණි. | පිළිගනිමි. | නිවැරදි ස්ථාවර වත්කම් වටිනාකම ගිණුම්ගත කළයුතු වේ. |
| (එ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය අනුව මුදල් හා මුදල් සමාන දෑ රු.7,907,273 ක් වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වර්ෂයේ ශුද්ධ මුදල් වැඩිවීම හා ආරම්භක මුදල් ශේෂයේ එකතුව රු.15,075,777 ක් ලෙස දක්වා තිබුණි. | පිළිගනිමි. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළයුතු වේ. |
| (ඒ) | 2019 වර්ෂයට අදාළව ලැබිය යුතු රු.636,154 ක කුලී ආදායමක් සමාලෝචිත වර්ෂයට අදාළ ආදායමක් ලෙස ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ලාභය එම වටිනාකමින් වැඩිවී තිබුණි. | පිළිගනිමි. | ඉකුත් වර්ෂවලට අදාළ ආදායම් සමුච්චිත අරමුදලට ගැලපුම් කළයුතු වේ . |
| (ඔ) | සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කළ සපිරිගමක් ව්‍යාපෘතියට අදාළව කැබිතිගොල්ලැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලැබිය යුතු පරිපාලන ගාස්තු ආදායම් රු.119,778 ක් ගිණුම්ගත කර නොතිබුණි. | පිළිගනිමි. | සමාලෝචිත වර්ෂයට අදාළ ලැබිය යුතු ආදායම් ගිණුම්ගත කළයුතු වේ. |
| (ඕ) | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අයවිය යුතු මුද්දර ගාස්තු ආදායම් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | පිළිගනිමි. | සමාලෝචිත වර්ෂයට අදාළ ලැබිය යුතු ආදායම් ගිණුම්ගත කළයුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ක) | සභාවේ නිලධාරීන් මැතිවරණ රාජකාරී සඳහා සහභාගී වීම වෙනුවෙන් දැරූ වියදම් ප්‍රතිපූර්ණය සඳහා මැතිවරණ කාර්යාලයෙන් ලැබුණු රු.37,870 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ආදායම එම වටිනාකමින් වැඩිවී තිබුණි. | පිළිගනිමි. | මැතිවරණ වියදම් ප්‍රතිපූර්ණය කිරීම සඳහා වූ ලැබීම් සභාවේ ආදායම් ලෙස නොගත යුතු වේ. |
| (ග) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණයගැතියන් ලෙස ගිණුම්ගතවී නැති 2018 වර්ෂයේ සිදුකළ ව්‍යාපෘති 02 කට අදාළව පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලැබුණු රු.770,342 ක් සමාලෝචිත වර්ෂයේ ණයගැති ලැබීමක් ලෙස ගිණුම්ගත කිරීම නිසා කර්මාන්ත ණයගැති ශේෂය එම වටිනාකමෙන් අඩුවී තිබුණි. | පිළිගනිමි. | නිවැරදි ණයගැති වටිනාකම ගිණුම්ගත කළයුතු වේ. |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.13,087,914 ක් වූ ගිණුම් විෂයයකට අදාළව විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | පිළිගනිමි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව පිළියෙල කළ බවට තහවුරු කිරීම් ඉදිරිපත් කළයුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම් රු.34,692,161 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.688,371 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **කුලී** | | |
| | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අයවිය යුතු රු.915,884 ක කුලී ආදායම් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පිළිගනිමි. | හිඟ කුලී අයකර ගැනීමට ක්‍රියාකළයුතු වේ. |

(ආ) බලපත්‍ර ගාස්තු

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයකරගත යුතු රු.94,820 ක හිඟ වෙළඳ බලපත්‍ර ගාස්තු සහ ව්‍යාපාර 95 ක් වෙනුවෙන් ලැබිය යුතු රු.380,000 ක පරිසර බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් සම්බන්ධයෙන් නීතිමය කටයුතු කිරීමට කටයුතු කරමි | අදාළ හිඟ ගාස්තු අයකර ගැනීමට ක්‍රියාකළයුතු වේ |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 නොවැම්බර් 22 දිනැති අංක 2151 දරන ගැසට්පත්‍රය අනුව ජලය බෙදා හැරීම සඳහා ලීටරයකට රුපියලක් බැගින් අයකළයුතු වුවත් සභාව සතු ලීටර් 8000 ක ධාරිතාවයකින් යුතු ජල බවුසරයක් සමාලෝචිත වර්ෂය තුළදී දින 93 ක් ජල බෙදාහැරීම වෙනුවෙන් ලැබිය යුතු රු.564,000 ක් අයකර ගෙන නොතිබුණි. | පිළිගනිමි. | අදාළ ගැසට් පත්‍රය ප්‍රකාරව ජල ආදායම් ලබා ගැනීමට ක්‍රියාකළයුතු වේ. |
| (ආ) | 2019 නොවැම්බර් 22 දිනැති අංක 2151 දරන ගැසට්පත්‍රය අනුව සමාලෝචිත වර්ෂය තුළදී සභාව සතු බැකෝලෝඩර් යන්ත්‍රයේ ධාවනය කරන ලද මීටර් පැය 432.7 ක් සඳහා රු.1,298,100 ක් අයවිය යුතු වුවත් කුලී ආදායම ලෙස රු.647,900 ක් පමණක් අයකරගෙන තිබුණි. | පිළිගනිමි. | ගැසට්පත්‍රය අනුව කුලී පදනමින් ධාවනය කිරීම් සඳහා වූ ආදායම් අයකර ගැනීමට ක්‍රියාකළයුතු වේ. |
| (ඇ) | සභාව විසින් පරිහරණය කරනු ලබන රු.361,725,000 ක වටිනාකමකට තක්සේරු කර ඇති ඉඩම් අක්කර 286.5 ක් සඳහා වූ හිමිකම් සහතික සහ පිඹුරුපත් ඉදිරිපත් නොකෙරුණි. | පිළිගනිමි. | මෙම ඉඩම් සභාවට පවරා ගෙන හිමිකම් සහතික ලබාගත යුතු වේ. |

## 3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2017 වර්ෂයේ රු.45,000,000 ක් වැයකර කැබිතිගොල්ලෑව බස් නැවතුම්පළ වෙළඳ සංකීර්ණ භූමියේ කඩ කාමර 46 ක් ඉදිකර තිබුණු නමුත් සභිකයන් විසින් විවෘත ටෙන්ඩර් කිරීමට විරුද්ධවීම නිසා කඩ කාමර 19 ක් 2022 පෙබරවාරි 28 දින වනවිටත් නිශ්කාර්යව පැවතුණි. | පිළිගනිමි. | මෙම කඩකාමර බදුදීමට කඩිනමින් ක්‍රියාකළයුතු වේ. |